# සබරගමු මහ සමන් දේවාලයේ පුරාවිද්‍යාත්මක හා වාස්තුවිද්‍යාත්මක පසුබිම

ඒ.එම්.එන්.ඩී.අත්තනායක[1],එච්.එම්.ඩබ්.ටී.දයානන්ද[2], කේ.පී.ඒ.එච්.පතිරණ[3]

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,රුහුණ විශ්වවිද්‍යාලය
nimmidinesha@gmail.com
[2] සමාජ විද්‍යාඅධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
thakshaladayananda93@gmail.com
[3] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
hansanipathirana3@gmail.com

මුඛ්‍ය පදඃ සුමන සමන් දේවාලය, වාස්තුවිද්‍යාව, සබරගමු, පුරාවිද්‍යාත්මක, උරුමය

## හැඳින්වීම

සුමන සමන් දෙවියන් වෙනුවෙන් ඉදිකර තිබෙන ප්‍රධාන දේවාලය ලෙස සැලකෙන්නේ රත්නපුරයේ පිහිටි මහ සමන් දේවාලයයි. සබරගමුවේ ඓතිහාසික ස්ථාන අතරින් ශ්‍රී පාදස්ථානයට පමණක් දෙ වැනි වූ මෙම දේවාලය ඓතිහාසික පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථානයකි. රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවාලයගාව ග්‍රාම නිළධාරී වසමේ මහ සමන් දේවාලය පිහිටා තිබේ. බටහිරින් සමනළ කඳු වැටියෙන් ද දකුණු දෙසින් කළු ගඟින් ද උතුරු දෙසින් රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද නැගෙනහිරින් ගල්කඩුව ග්‍රාමය ද බස්නාහිරින් කහන්ගම ගම් පියසින් ද වට වී ඇත. වත්මන් සමන් දෙවොල පිහිටි භූමිය අක්කර 5 ක් පමණ ප්‍රමාණයකින් යුක්ත වේ. කළු ගඟට මායිම්ව පිහිටා ඇති රමණීය කඳු වැටියක් මත සමන් දේවාලය ඉදි කොට තිබේ. දඹදෙණි රාජ්‍ය සමය දක්වා දිවයන ඉතිහාසයකින් යුක්ත වන මෙම දේවාලය දඹදෙණියේ දෙ වැනි පරාක්‍රමබාහු රජු විසින් මුල් වරට ඉදි කළා යැයි සැලකේ. නමුත් අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත් කරන ලද්දේ කෝට්ටේ පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේදී ය. ක්‍රි.ව. 1618 දී සමන් දේවාලය ආශ්‍රිත සියලු ඉදි කිරීම් පෘතුගීසින් විනාශ කිරීමෙන් පසු ව වර්තමාන සමන් දේවාලය සම්පූර්ණයෙන්ම දෙ වැනි රාජසිංහ රජු විසින් (ක්‍රි.ව.1629-1687) ඉදි කරන ලදී. සමන් දේවාලය ඉතිහාසයේ පටන් විවිධ නම්වලින් හඳුන්වා තිබේ. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ පැමිණි සය වැනි පැරකුම්බාගේ සමන් දේවාල සෙල්ලිපියෙහි ලක්‍ෂමණ මහා දේවාලය යනුවෙන් හඳුන්වා දී තිබේ. ඊට හේතුව වන්නේ 16-17 සියවස්වල මෙරට ජනයා සමන් දෙවියන් ලක්‍ෂමණ ලෙස සැලකීම නිසා ය. දේශීය ජනයාගෙන් පමණක් නොව විදේශීය ජනයාගේ ද අවධානය යොමු වී තිබෙන සබරගමු මහ සමන් දේවාලය ලාංකික සංස්කෘතිය විදහාපාන පූජනීය ස්ථානයකි. ඒ අනුව පුරාවිද්‍යාත්මක මෙන්ම වාස්තුවිද්‍යාත්මක දේශීය ඥානය පිළිබිඹු වෙන දේවස්ථානයක් ලෙස මෙම අධ්‍යයනය සඳහා පාදක වූ මහ සමන් දේවාලය පෙන්වාදිය හැකිය. ඉතිහාසයේ පැතිකඩක් නිරූපණය කරන රත්නපුර මහ සමන් දේවාලයේ පුරාවිද්‍යාත්මක හා වාස්තුවිද්‍යාත්මක වටිනාකම් කෙතෙක් දුරට වර්තමානයේ පවතී ද යන්න අධ්‍යයනය මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වේ.

### අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබාගැනීම පිණිස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලදි. සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනයේ දී සමන් දේවාලය සම්බන්ධව ලිය වී ඇති පොත්පත්, ලිපි ලේඛන සහ අන්තර්ජාලය වැනි දේ උපයෝගී කරගත් අතර ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී මානව කෘති පිළිබඳ ව අධ්‍යනය, නිරීක්ෂණය සහ ඡායාරූප ගත කිරීම වැනි ක්‍රමවේදයන් ඔස්සේ දත්ත රැස් කරගන්නා ලදි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

සබරගමු මහ සමන් දේවාලය ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථානයකි. මෙම දේවාලයේ වාස්තුවිද්‍යාත්මක නිර්මාණයන් සමන් දේව වන්දනය උදෙසා කෙරෙන වත්පිළිවෙත්වලට අවශ්‍ය සැලැස්මක් මත ඉදිකළ ඒවාය. එම නිර්මාණයන් අතර සඳුන් කුඩම, දිග්ගෙය , ශාන්ති මණ්ඩපය ආදී ගෘහ නිර්මාණයන් සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරන බව නිර්ණය වේ. දේවාල භූමිය මත දේවාලය තැනීමේ දී එහි ප්‍රධාන දොරටුව දේවාලයට ඊසාන දිගින් ගොඩනගා ඇත. එම දොරටුව අසලට පැමිණි පසු උතුරු දිශාවෙන් සමන් ගිර දර්ශනය වේ. දේවාල මළුවේ ඉහළ මළුව සහ පහළ මළුව වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වේ. පහත මළුවට අයත් භූමිය ප්‍රධාන දොරටුවට උතුරු පැත්තෙන් වාහල්කඩක් දැකගත හැකිය. දේවාලය පැත්තෙන් බැලුවිට පියගැට පෙළ හා කුරගෙවල්වලින් දේවාල භූමිය වට වී ඇති ආකාරයක් දැකගත හැකිය. මෙවැනි තවත් සුවිශේෂි කලා නිර්මාණයන් අතර ශාන්ති මණ්ඩපයට ඇතුළු වන ප්‍රධාන දොරටුව අභියස ඉදි කර ඇති වාහල්කඩ ප්‍රධාන වේ. මෙහි දෙපස ශෛලමය උලුවස්සක් යොදා තිබේ. එම උලුවස්සේ විශේෂත්වය වන්නේ ගල් උලුවහු කොටස් දෙකක් ආශ්‍රයෙන් වාහල්කඩ නිර්මාණය කර තිබීමයි. එක් පැත්තක ඉහළ කොටසේ දක්නට ලැබෙන චිත්‍ර මෝස්තරය අනෙක් පැත්තට යොදා නොමැති වීමද මෙහි තිබෙන තවත් සුවිශේෂී ලක්ෂණයකි. නමුත් වාහල්කඩට අයත් ඇතුළු බිත්තියෙහි දේවාලයට මුහුණලා චිත්‍රණය කර ඇති සිවුවටුක සිතුවම් දෙකක් දක්නට ලැබේ.

දේවාලය හා සම්බන්ධ කුමාර රථය නවතා තැබීම සඳහා නිර්මාණය කර ඇති රථගෙය ද තවත් විශේෂ ගෘහාංගයක් ලෙස පෙන්වාදිය හැකිය. කුරුවිට බෙත්මට අයත් මඩමක හා උඩ මළුවේ කුරගෙයට අයත් තාප්පය අතර තනා ඇති මෙහි වහල පල හතරකින් සහ පෙති උළුවලින් ආවරණය කර තිබෙන මෙකී නිර්මාණය වෙනත් දේවාලවල දැකගත නොහැකි අන්දමේ නිර්මාණයන්ට වඩා සුවිශේෂී වේ. එමෙන්ම සමන් දේවාලයේ පහත මළුවේ සිට ඉහළ මළුවට යාම සඳහා තනවා ඇති පඩිපෙළක් දැකිය හැකිය. ඒ දෙපස කුඩා බැම්මක් තනවා ඇති අතර පඩිපෙළආරම්භයේ පඩිපෙළට සම්බන්ධ කර පහත මාලයේ තනවා ඇති සඳගල නම් අර්ධ වෘර්තාකාර ගලක් දැක ගත හැකිය. ඉහත දැක්වූ පඩිපළටම සම්බන්ධ කොට ඇති තවත් විශේෂ ස්ථානයක් ලෙස පත්තිරිප්පුව හඳුනාගත හැකිය. පෙරහැර පැවැත්වීමේ දි ඇතු පිට කරඬුව තැන්පත් කිරීම සඳහා යොදා ගැනීමට උචිත පරිදි නිර්මාණය කර ඇති මෙය වර්තමානයේ දී පවා පෙරහැර චාරිත්‍රයන්වලදී යොදා ගන්නා බවට අනාවරණය විය.

තවත් සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් වන ශාන්ති මණ්ඩපය වූ කලී එක් පැත්තකින් දිග් ගෙය සහ අනෙක් පැත්තෙන් වාහල්කඩ සහිත ප්‍රධාන දොරටුවට සම්බන්ධ කර නිර්මාණය කර තිබේ. ඊට දෙපසින් යොදා ඇති අත්තිවාරම් මත අඩි 4 ක්

පමණ උසින් යුත් කෙටි තාප්පයකින් හා වෘත්තාකාරව සකස් කළ කණු පහකින් යුක්ත වේ. දෙපස වහලයට අයත් යට ලී වල ආධාරකය වශයෙන් යොදා ඇති මෙම කණු දහය යෙදීම නිසා ශාන්ති මණ්ඩපයට අවශ්‍ය වාතාශ්‍රය ලැබෙන පරිදි නිර්මාණය කරතිබේ. ශාන්ති මණ්ඩපයට අඩියක් උසින් කුඩා වේදිකා දෙකක් නිර්මාණය කර තිබීම සුවිශේෂත්වයකි.

ශාන්ති මණ්ඩපයේ වම්පස තනා ඇති වේදිකාවට අයත් බිත්තියෙහි සමන් දේවාල සෙල්ලිපියට අනුව දෛනික හේවිසි වාදනය හා වාර්ෂික තේවාවන් පැවැත්වීම සඳහාත් පෙරහැර මංගල්‍ය අවසානයේ ගරා වෙස් පැම සඳහාත් ශාන්ති මණ්ඩපය යොදා ගත් බවට විද්‍යාමාන වේ. වර්තමානයේ දී ද මෙම ගොඩනැගිල්ල ඉහත කාර්යයන් සඳහා යොදා ගන්නා බවට අනාවරණය විය.

සමන් දේවාල භූමියේ ඇති පුරාවිද්‍යාත්මක නටඹුන් අතර පෘතුග්‍රීසි යුගයට අයත් ශෛලමය ලාංඡන දෙකක්, පැරණි පෘතුග්‍රීසි කාල තුවක්කුවක්, සිංහල අකුරු සහිත සෙල්ලිපියක කැබලි තුනක්, ඇත්දළ යුගලයක් ආදී වූ නටඹුන් සුවිශේෂිත්වයක් උසුලනු ලබන නිර්මාණ වේ. පෘතුග්‍රීසි සමයට අයත් ශෛලමය ලාංඡන දෙකෙන් එකක් රාජ්‍යතාන්ත්‍රික ලාංඡනයකි. එය අඩි 1 යි අඟල් 6 දිග අඩි එකක් පළල අඟල් 6 පමණ ඝණකමකින් යුක්ත වේ. අනෙක් ලාංඡනය ශෛලමය පුවරුවක කෙටූ කැටයමක් බඳු චිත්‍රයක් සහ පෘතුග්‍රීසි බසින් ලියවුණු සෙල්ලිපියකි. පෘතුගිසි යුධහමුදා නිල ඇඳුමෙන් සැරසුණු අයෙක් අසිපතක් හා පලිහක් දරමින් සිටින ආකාරයේ සහ සිංහල යුධ සෙබළෙකු බිම දමා පයින් පාගාගෙන සිටින අයුරු එම සිතුවම තුළින් පෙන්නුම් කරයි. සඳුන් කුඩමට බටහිරින් දේවාලයේ ජල පරිහරණය සඳහා සකස් කළ පුරාණ ළිඳ ද වර්තමානයේ ශේෂ වී තිබෙන පුරාවිද්‍යාත්මක නටඹුන් අතර සුවිශේසි ගණයෙහිලා සැලකිය හැකි නිර්මාණයකි.

## නිගමනය

රත්නපුර මහ සමන් දේවාලයේ පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක උරුමයන් වර්තමානය වන විට ද සුරක්ෂිත වී තිබෙන බව හඳුනාගත හැකිය. ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම මෙන්ම දේවාල භූමිය පූජා නගරයක් බවට පත් කිරිමේ දී ඇතුළත් කරන ලද වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ වර්තමානය දක්වා වැදගත් වී ඇති බව පෙනේ. අතීතයේ දී මෙන්ම වර්තමානයේදී ද සමන් දෙවියන් වෙනුවෙන් ඉටුකරන වත්පිළිවෙත් සඳහා මෙම ගොඩනැගිලි යොදාගැනීම මඟින් ඒ බව ප්‍රතයක්ෂ වේ. නමුත් දේවාලයට යන එන සහ ප්‍රදේශවාසින්ගෙන් වැඩි දෙනෙක් ඒ පිළිබඳ අවධානය යොමු නොකරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ආරියපාල, පී.ඇල්. (2012)***සපරගමුවේ මහ සමන් දෙවොල.***රත්නපුරඃචින්තන ප්‍රකාශන.

රත්නපාල, ඊ.එම්. (2001)***ශ්‍රී පාදය හා සමන් දෙවියෝ.***දිවුලපිටියඃසරස්වති.

රාජපක්ෂ, ශ්‍රියානි. (2009)***සමන් දේවාල පුද සිරිත්.***කොළඹඃඇස් ගොඩගේ සහ සහෝදරයෝ.